**අම්පාර නගර සභාව - 2022**

-----------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

අම්පාර නගර සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අම්පාර නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වර්තාකරන ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව නගර සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු ණය ශේෂය රු.395,642 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම සමඟ නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයට අදාළ වරිපනම් මත දුන් වට්ටම් මුදල රු.203,785 ක් ගිණුම්ගත කර නොතිබුණි. | 2023 වර්ෂයේ ගිණුම මඟින් දුන් වට්ටම් මුදල ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ අයකළ වරිපනම් දඩ මුදල් රු.519,148 ක් වරිපනම් මුදල් ලැබීම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ සිට වෙනත් ආදායම් ලෙස වරිපනම් දඩ ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පොදු ගබඩා තොග ශේෂය රු.954,010 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | පොදු ගබඩා තොග ශේෂය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ හා මන්ත්‍රී දීමනා ප්‍රතිපූර්ණ වටිනාකම රු.6,337,045 ක් ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගන්නා බව සහ ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.201,833 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.7,130,028 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | -එම- | -එම- |
| (ඌ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තානායම් සේවා ගාස්තු තැන්පතු ශේෂය රු.793,000 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ තානායම් සේවා ගාස්තු තැන්පතු ගිණුමේ ශේෂය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (එ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ණයහිමි ශේෂය රු.357,676 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි. | 2023 වර්ෂයේ ගිණුම මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |
| (ඒ) | සමාලෝචිත වර්ෂයට අදාළව තානායමේ ආරම්භක හා අවසන් තොග ගැලපීම්කර විකුණුම් පිරිවැය දැක්විය යුතු වුවත් ගැනුම් පිරිවැය දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.1,859,335 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | -එම- |
| (ඔ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත වෙනුවෙන් ගෙවිය යුතු හා ලැබිය යුතු රු.9,426,750 ක් ගිණුම්ගත කර නොතිබුණි. | -එම- | -එම- |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා**

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගිණුම් ශේෂ 04 ක එකතුව ලේඛන සහ උපලේඛන අනුව ශේෂ එකතුව අතර රු.2,700,480 ක නොසැසඳීමක් විය. | වෙනසට හේතුව සොයා බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදි ශේෂය හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිවැරදි කර ඉදිරිපත් කරන ලද තානායමේ වෙළෙඳ ලාභාලාභ ගිණුම අනුව විකුණුම් ආදායම සහ ආදායම් වියදම් ගිණුම අනුව විකුණුම් ආදායම අතර රු.1,667,914 ක නොසැසඳීමක් පැවතුණි. | 2023 වර්ෂයේ ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | -එම- |

### 1.6.3 අධිකාරි බලය නොලත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දී අනුමැතියකින් තොරව කඩ කුලී හිඟ ආදායම රු.632,062 ක් මූල්‍ය ප්‍රකාශනවලින් කපාහැර තිබුණි. | ආරම්භක ශේෂය නිවැරදි කිරීම සඳහා සිදුකරන ලද කපා හැරීමක් වන අතර එය නිවැරදි කිරීමට කටයුතු කරන බව. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.13,522,976 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,434,941 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2022 | | | | 2021 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම් | බිල්කළ ආදායම් | රැස්කළ ආදායම් | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i. | වරිපනම් හා බදු | 10,800,000 | 8,872,372 | 6,504,958 | 35,321,768 | 10,750,000 | 8,872,372 | 5,115,656 | 32,954,353 |
| ii. | කුලී ආදායම | 11,528,226 | 8,920,981 | 4,744,811 | 12,175,239 | 11,925,926 | 9,326,366 | 5,104,891 | 10,162,989 |
| iii. | බලපත්‍ර ගාස්තු | 3,702,000 | 1,635,448 | 1,635,447 | - | 3,402,000 | 1,456,160 | 1,456,160 | - |
| iv. | වෙනත් ආදායම් | 63,528,580 | 41,520,104 | 41,520,104 | - | 49,402,403 | 26,663,920 | 26,663,920 | - |
| v. | එකතුව | 89,558,806 | 60,948,905 | 54,405,320 | 47,497,007 | 75,480,329 | 46,318,818 | 38,340,627 | 43,117,342 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | **වරිපනම් හා බදු** | | |
| (අ) | නගර සභාව සතු වරිපනම් දේපල ඒකක 8592කට අදාලව තොරතුරු ඇතුළත් වරිපනම් කාඩ්පත් 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වර්ෂ 05ක කාලයක් | 2023 වර්ෂයේ ජනවාරිවලට අදාළව හිඟ ශේෂය ලබාගන්නා ලද්දේ මේ දක්වා හිඟ ශේෂය නිවැරදිව ලබාගැනීමටයි. මෙම | පරිගණක ගත පද්ධතිය සමඟ ලේඛන යාවත්කාලීනව පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තුළ කාර්තු පදනමින් තොරතුරු ඇතුළත් කර යාවත්කාලීන කර නොතිබුණු අතර 2023 ජනවාරි ශේෂය පමණක් සෘජුවම සටහන් කර තිබූ බව නිරීක්ෂණය විය. | හිඟ ශේෂයට අදාළ වටිනාකම් කාර්තුවෙන් කාර්තුවට ලබාගෙන ශේෂය නිවැරදිව සටහන් කිරීමට කටයුතු කරන බව. | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහට වරිපනම් ශේෂය රු.35,321,768 ක් විය. | 2023 වර්ෂයේ සිට හිඟහිට වරිපනම් අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග සැලසුම් සකස් කරමින් පවතින බව. | පනතේ විධිවිධාන අනුව හිඟ මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| | **කුලී** | | |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි කඩ කාමර කුලී ශේෂය රු.12,175,239 කින් රු.10,479,079 ක් එනම් සියයට 86 ක් නවීකරණය කරන ලද බස් නැවතුම්පල කඩ කාමරවලින් අයවිය යුතුව පැවතුණි. | 2023 වර්ෂයේ සිට හිඟ බස් නැවතුම්පල කඩකුලිය අයකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග සැලසුම් සකස්කරමින් පවතින බව. | හිඟ මුදල් අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2021 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය මගින් ඉදිරිපත් කර තිබූ නිර්දේශ විගණිත දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | ඉදිරියේ දී 2022 වර්ෂයේ වාර්ෂික සමීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව. | භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ කාල ප්‍රමාදයකින් තොරව ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | වලංගු ගිවිසුම් කාලය ඉක්මවා තිබූ නගර සභාව සතු කඩකාමර 152 ක ගිවිසුම් යාවත්කාලීන කිරීමට නගර සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | මෙම කඩ කාමර 152 ක සඳහා ගිවිසුම් යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු සඳහා ගරු ආණ්ඩුකාරතුමා හට ලිඛිතව දන්වා ඇති බව. | කඩිනමින් අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | නගර සභා බල ප්‍රදේශයට අයත් දේපල මත 2005 වර්ෂයේ තක්සේරුව මත පදනම්ව වරිපනම් බදු අයකරමින් පැවතුණි. | නව තක්සේරුවක් සිදුකිරීමට අවශ්‍ය සියලු කටයුතු සිදුකර තක්සේරු දෙපාර්තමේන්තුවට යොමු කොට ඇති බව. | කාලීනව තක්සේරුකර බදු මුදල් අයකරගත යුතුය. |
| (ආ) | නගර සභාව සතු කඩකාමර 142 ක් වෙනුවෙන් අයකරනු ලබන කඩකුලී කාලීනව තක්සේරු කර නොතිබුණි. | ඉදිරියේ දී තක්සේරු කර අය කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | -එම- |

## 3.3 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | නගර සභාවට අයත් ඉඩම් 42 ක හා එම ඉඩම්වල පිහිටි ගොඩනැගිලිවල වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කිරීමට හා ස්ථාවර වත්කම් ලේඛනවල ඇතුළත් කිරීමට කටයුතු කර නොතිබුණි. | නගර සභාවට අයත් දේපල තක්සේරු කිරීම සඳහා මධකලපු තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබුණ ද මේ වන තෙක් තක්සේරු කර වාර්තා ලබා දී නොමැති බව. | වටිනාකම හඳුනාගෙන ලේඛනගත කිරීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නගර සභාවට අයත් රු.192,414,809 ක් වටිනා යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, මෝටර් රථ හා කරත්ත සහ ලී බඩු සවිකිරීම් යන ස්ථාවර වත්කම් වර්ගීකරණයන් යටතේ එක් එක් අයිතමයන්ට අදාළ වටිනාකම් ඇතුළත් උපලේඛන සකස් කර ගිණුම සමඟ ඉදිරිපත් කිරීමට හා ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මඟින් අදාළ උපලේඛන සකස් කර ගිණුම සමඟ ඉදිරිපත් කිරීමට හා ස්ථාවර වත්කම් ලේඛන යාවත්කාලීන කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන බව. | දෙසැම්බර් 31 දිනට වටිනාකම ඇතුළත් උපලේඛන සකස් කිරීමට හා ලේඛන යාවත්කාලීනව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | නගර සභාව වෙත සමාලෝචිත වර්ෂයේ පරිත්‍යාග ලෙස ලද පුස්තකාල පොත් 71 ක්, වතුර පොම්පයක් සහ ඩිස්ප්ලේ බොක්ස් එකක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ සිට වත්කම් වටිනාකම සමඟ ලේඛනයක් පවත්වා ගෙන යාමට කටයුතු සිදුකරන අතර පරිත්‍යාග ලෙස ලැබුණු ද්‍රව්‍ය ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. | වටිනාකම හඳුනාගෙන ලේඛනගත කිරීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඈ) | නගර සභාව සතු වාහන අයිතම 04 ක වටිනාකම හඳුනාගෙන ලේඛනගත කිරීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී එම වාහන ලේඛනගත කිරීමට හා ගිණුම්ගත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමි. | වටිනාකම හඳුනාගෙන ලේඛනගත කිරීමට හා ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | නගර සභාව භාරයේ පවතින වාහන 19ක අයිතිය නගර සභාව නමට පවරා ගෙන නොතිබුණි. | ඉදිරි වර්ෂයේ දී පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමි. | කාල ප්‍රමාදයකින් තොරව පවරා ගැනීම් කටයුතු සිදුකළ යුතුය. |
| (ඊ) | නගර සභාව සතුව පවතින අලුත්වැඩියා කළ නොහැකි තත්ත්වයේ පවතින වාහන 12 ක් සුදුසු පරිදි අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේ දී මේ සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීමට කටයුතු කරමි. | වාහන සුදුසු පරිදි අපහරණය කළ යුතුය. |

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| නගර සභාවේ ලේකම් තනතුර හා ගණකාධිකාරී තනතුර ඇතුළුව තනතුරු 76 ක් පුරප්පාඩුව පවතින බව නිරීක්ෂණය වූ අතර ඉන් තනතුරු 43 ක් එනම් පුරප්පාඩුවලින් සියයට 58 ක ප්‍රමාණයක් සඳහා අනියම් පදනම මත බඳවා ගැනීම් සිදුකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.17,119,194 ක් නගර සභා අරමුදලින් වැටුප් ලෙස ගෙවීම් සිදුකර තිබුණි. | සේවක පුරප්පාඩු පිළිබඳව පළාත් පාලන කොමසාරිස් දැනුවත් කිරීමට කටයුතු කර ඇති බව. | පුරප්පාඩු සඳහා ස්ථිර නිලධාරීන් ඉල්ලුම්කර අදාළ ආයතන දැනුවත් කළ යුතුය. |